ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

**<u>ශ්‍රී ලංකා - ඉන්දියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය ශ්‍රී ලංකාවේ 10 වන පාර්ලිමේන්තුවේ දී ස්ථාපනය කෙරේ.</u>**

ශ්‍රී ලංකාවේ 10 වන පාර්ලිමේන්තුව සඳහා ශ්‍රී ලංකා - ඉන්දියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය කතානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් 2025 මැයි 08 වන දින පාර්ලිමේන්තු පරිශ්‍රයේ දී ස්ථාපනය කෙරිණ. ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් මෙම අවස්ථාවට සහභාගී විය.

2. අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ විවිධ පක්ෂවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු 100කට අධික සාමාජිකයන් පිරිසක් මෙම හමුව සඳහා සහභාගී වූහ. හමුව අතරතුර දී සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා සංගමයේ සභාපතිවරයා වශයෙන් තේරී පත් විය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ජී.ජී. පොන්නම්බලම්, ජේ. සී. අලවතුවල, තනුර දිසානායක සහ රවි කරුණානායක යන මහත්වරුන් උප සභාපතිවරුන් ලෙස තේරී පත් විය. වෛද්‍ය කාවින්ද හේෂාන් ජයවර්ධන මහතා ලේකම්වරයා වශයෙන් තේරී පත් විය. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන සිවඥානම් ශ්‍රීධරන් සහ අනුෂ්කා තිලකරත්න යන මහත්ම මහත්මීන් සහකාර ලේකම්වරුන් ලෙස ද වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍ය සුන්දරලිංගම් ප්‍රදීප් මහතා සංගමයේ භාණ්ඩාගාරික ලෙස ද තේරී පත් විය.

3. ඉන්දීය පාර්ලිමේන්තුවේ කතානායක ශ්‍රී ඕම් බිර්ලා මහතා ශ්‍රී ලංකා - ඉන්දියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය යළි ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් කතානායකතුමාට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සුභාශිංසන එක් කරමින් සුභ පැතුම් ලිපියක් එවා තිබිණ.

4. මෙම අවස්ථාවේ අදහස් දක්වමින් කතානායක වෛද්‍ය ජගත් වික්‍රමරත්න මහතා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින අසමසම ඓතිහාසික, ආගමික සහ සංස්කෘතික සබඳතාවය අවධාරණය කළේය. ඉන්දියාව ශ්‍රී ලංකාවේ විශ්වාසවන්ත මිතුරකු බව නැවත නැවතත් පසක් කර තිබෙන බව පැවසූ එතුමා ද්විපාර්ශ්වික හවුල්කාරිත්වය තවදුරටත් අඛණ්ඩව ඉහළ නැංවිය යුතු බව සඳහන් කළේය.

5. මේ අතර මෙම අවස්ථාව අමතමින් මහ කොමසාරිස්තුමා 'ශිෂ්ටාචාරමය නිවුන් සහෝදරයන්' බඳු ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර බවතින ප්‍රජාතාන්ත්‍රීය සම්ප්‍රදායන් අවධාරණය කළේය. සංගමයේ සභාපතිතුමා, නිලධාරී මණ්ඩලය සහ සාමාජිකයන්ට සුභාශිංසන එක් කළ එතුමා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ජනතාව අතර සබඳතා තවදුරටත් ශක්තිමත් කරනු ඇති බවට විශ්වාසය පළ කළේය.

6. අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා 2025 අප්‍රේල් මස සිදු කළ ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී ශ්‍රී ලාංකිකයන් සඳහා පුහුණු අවස්ථාවන් 1000ක් පිරිනමන බව නිවේදනය කළේය. මෙම පුහුණු අවස්ථා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, සිවිල් සේවකයන්, ව්‍යවසායකයින්, සංගීත සහ සිනමා ඇතුළු ක්ෂේත්‍රයන්හි නිරතවන්නන් සඳහා පිරිනැමෙනු ඇත. මේ යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් සමන්විත පළමු කණ්ඩායම 2025 මැයි මාසයේ දී ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයන් සඳහා පාර්ලිමේන්තු පර්යේෂණ සහ පුහුණු ආයතනය විසින් පවත්වන සතියක පුහුණුවක් සඳහා නවදිල්ලිය බලා පිටත් වනු ඇත.

7. ශ්‍රී ලංකා - ඉන්දියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය 2024 දෙසැම්බර් මාසයේ දී ශ්‍රී ලංකා ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා විසින් සිදු කළ ඉන්දීය සංචාරය අතරතුරදී එතුමා සහ අග්‍රාමාත්‍ය ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද 'පොදු අනාගතයක් උදෙසා හවුල්කාරිත්වයන් ප්‍රවර්ධනය කරමින්' යන ඒකාබද්ධ දැක්ම ක්‍රියාත්මක කිරීමේ තවත් පියවරකි. ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් ප්‍රවර්ධනය කිරීම සහ ආයතනික මනා පිළිවෙත් පිළිබඳ ප්‍රවීණත්වය බෙදා හදා ගැනීම සඳහා වන පාර්ලිමේන්තු මට්ටමේ නිරන්තර හුවමාරු දෙරට අතර ද්විපාර්ශ්වික බැඳීම් තවදුරටත් ශක්තිමත් කරනු ඇති අතර මිත්‍රශීලී සහ අසල්වැසි සබඳතා නව මානයකට රැගෙන යනු ඇත.

****

කොළඹ
*2025 මැයි 9*